# කාර්යසාධන වාර්තාව
# செயற்பாட்டு அறிக்கை
# Performance Report



## 2014


ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத்
திணைக்களம்
நிதி திட்டமிடல் அமைச்சு

Department of Project Management and Monitoring
Ministry of Finance and Planning

## පටුන


01 හැඳින්වීම ........................................................................................................................ 1

02 දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක........................................................................................ 1

03 සංවිධාන ව්‍යුහය..........................................................................................................................2

3.1 දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු...................................................................... 3
3.2 අයවැය තොරතුරු.......................................................................................................................... 3

04 දෙපාර්තමේන්තුවේ කාර්යභාරය.........................................................................................................4

4.1 අධීක්ෂණ ක්‍රමවේදයන්.................................................................................................................... 4

4.1.1 ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය.................................................................... 4-5
4.1.2 දේශීය සහ විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ත්‍රෛමාසිකව, කාර්තුමය ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතිය තුළින් අධීක්ෂණය කිරීම.............6
4.1.3 ප්‍රගති වාර්තා මගින් අධීක්ෂණය කිරීම.......................................................................... 6

4.2 ජාතික මෙහෙයුම් මැදිරිය (NOR) පවත්වාගෙන යාම.................................................................. 7

4.3 ක්ෂේත්‍ර චාරිකා මගින් ප්‍රගතිය අධීක්ෂණය කිරීම.......................................................................... 7-9

4.4 විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම........................................................................................ 9

4.5 ඇගයීම හා නිරීක්ෂණ තොරතුරු ව්‍යාප්ත කිරීම...............................................................................10

4.5.1 ඇගයීම් තොරතුරු පද්ධතිය (EIS) පවත්වාගෙන යාම.......................................................10
4.5.2 ව්‍යාපෘති ඇගයීම..................................................................................................................10

5 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ වූ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය (ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ උපායමාර්ගිකව ඉහළ නැංවීම)........................................................................................................10

6 විශේෂ ක්‍රියාකාරකම්.........................................................................................................................11

6.1 "සංවර්ධන ව්‍යාපෘතින්හි කාර්යසාධනය -2014" ප්‍රකාශයට පත්කිරීම.................................................11

6.2 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව කෙරෙන සංවර්ධන වැඩ අධීක්ෂණය කිරීම..............................11

6.3 අයවැය යෝජනා අධීක්ෂණය කිරීම..................................................................................................... 11

6.4 පෝෂණ මල්ල වැඩසටහන ඇගයුමට ලක් කිරීම................................................................................. 11

6.5 නියඟයෙන් පීඩාවට පත් ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ සහනාධාර ලබාදීම අධීක්ෂණය.................................................................................................................................. 12

7 කාර්යමණ්ඩල පුහුණු කිරීම සහ හැකියා වර්ධනය........................................................................... 12

## 01 හැඳින්වීම

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම වගකීම වනුයේ රජයේ සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති කඩිනමින් සහ ඵලදායි ලෙස ක්‍රියාත්මකවීම තහවුරු කිරීම සඳහා අදාළ සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ ඇගයීමට ලක් කිරීමයි.

දස අවුරුදු සංවර්ධන සැලැස්මට අනුව, රට තුළ තිරසාර ආර්ථික වර්ධනයක් සමඟ සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක්ද ලඟා කර ගැනීම රටේ සමස්ත සංවර්ධන ඉලක්කය වේ. මෙම ජාතික අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා දෙපාර්තමේන්තුව විසින් මනා කළමනාකරණයක් හා අධීක්ෂණයක් පවත්වා ගනිමින් සහ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරිත්වය ඒවායේ සැලසුම් අනුව විශ්ලේෂණය කිරීම තුළින් ඒවායේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා මග පෙන්වීමත් පහසුකම් සැලසීමත් සිදු කරනු ලැබේ.

ඒ අනුව, රටෙහි සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමෙහිලා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව පුළුල් භූමිකාවක් ඉටු කරයි. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම තුළින් සංවර්ධන ව්‍යාපෘතීන්හි ඵලදායීතාවය තහවුරු කිරීමට දායක වීමේ අපේක්ෂාවෙන්, දෙපාර්තමේන්තුව විසින් අන්තර්ජාලගත පරිගණක අධීක්ෂණ පද්ධතියක් වන “ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය” (INDIS) හඳුන්වා දී ඇත. එමෙන්ම රේඛීය අමාත්‍යාංශයන්හි අයවැයගත වියදම් පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා ද පරිගණක පද්ධතියක් පවත්වාගෙන යයි. දෙපාර්තමේන්තුවට අයත් ජාතික මෙහෙයුම් මැදිරිය තුළ පවත්වාගෙන යනු ලබන එම තොරතුරු පද්ධතිය භාවිතයෙන් සියළු සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයින්, සංවර්ධන හවුල්කාර පාර්ශ්වයන්, පරිපාලන නිලධාරීන් සහ පොදු මහජනතාවට නිවැරදිව හා කඩිනමින්, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මඟින් ලබා දීමේ හැකියාව ඇත.

මෙයට අමතරව රේඛීය අමාත්‍යාංශ, සංවර්ධන හවුල්කරුවන්, ව්‍යාපෘති කාර්ය මණ්ඩල සහ අදාළ අනෙකුත් ආයතන සමග සිදු කරනු ලබන ආංශික සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් මඟින් සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ගැටළු නිරාකරණය කිරීම සඳහා ද දෙපාර්තමේන්තුව අවශ්‍ය පහසුකම් සලසයි. තවද , ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය සහ කාර්තුමය ප්‍රගති වාර්තා මඟින් ඉදිරිපත් කරනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘතීන්හි බිම් මට්ටමේ තත්ත්වයන් අවබෝධ කර ගැනීම පිණිස ක්ෂේත්‍ර නිරීක්ෂණයන් ද සිදු කරනු ලැබේ.

තත් අරමුණු සාක්ෂාත් කර ගැනීමේහිලා මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන සංවර්ධන තේමාවන්ට අනුව අංශ 04ක් යටතේද එම සියළුම අධීක්ෂණ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පහසුකම් සැපයීමට ආයතන හා මූල්‍ය කටයුතු සඳහා වෙන්වූ අංශයක්ද ඇතුළුව අංශ අංශ 05 ක් යටතේ ව්‍යුහගතකර ඇත. මෙම වාර්තාව මඟින් දෙපාර්තමේන්තුවේ 2014 වසර තුල කාර්යසාධනය ඉදිරිපත් කෙරේ.

## 02 දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක සකස් කිරීමේ දී ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කර ඇත්තේ රජයේ සංවර්ධන අරමුණු සහ ඉලක්ක ඵලදායි අයුරින් ලඟා කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කෙසේ සකස් විය යුතුද යන්න කෙරෙහිය.

**දැක්ම**

"සඵලදායි සංවර්ධනයක් අත්පත් කර ගැනීම උදෙසා ප්‍රධාන හවුල්කරු වීම"

**මෙහෙවර**

"ප්‍රතිඵල සහතික කිරීම පිණිස රජයේ සියලු සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් කටයුතු කිරීම"

**අරමුණු / ඉලක්ක**

i. රජයේ ප්‍රතිපත්ති,වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය සහ පසු විපරම් කිරීම

ii. විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම, විදේශ අරමුදල් භාවිතයෙන් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන්වල ප්‍රගතිය වේගවත් කිරීමට සහාය වීම

iii. වාර්ෂික වැය ඇස්තමේන්තු කාර්යක්ෂම සහ සඵලදායි ලෙස ක්‍රියාත්මක වන්නේ දැයි සොයා බැලීම

iv. විදේශ අරමුදල් භාවිතා කිරීමේ දුර්වලතා මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම

v. රාජ්‍ය ආයෝජන සැලැස්මේ සඳහන් ඉතා වැදගත් සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණයට භාජනය කිරීම සහ එම ව්‍යාපෘතීන් නියමිත කාල සීමාව තුළ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීමට අවශ්‍ය මග පෙන්වීම

vi. තෝරාගත් ප්‍රධාන ව්‍යාපෘති හා වැඩසටහන් ඇගයීම සහ එමගින් ඉදිරි ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම් ලබා දීම

vii. විද්‍යුත් සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණ තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම සහ එම පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ සංවර්ධන කළමනාකරුවන්ට සියළුම සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ අත්‍යාවශ්‍ය සහ වැදගත් තොරතුරු ලබා දීමට අවශ්‍ය පහසුකම් සැපයීම

## 03 සංවිධාන ව්‍යුහය

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් හතරදෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ අංශ 05 කින් ක්‍රියාත්මක වේ. එම අංශ පහත පරිදිය.

I. යටිතල පහසුකම් සංවර්ධන අංශය
II. මානව සම්පත් සංවර්ධන අංශය
III. වෙළඳ හා කාර්මික සංවර්ධන අංශය
IV. කෘෂිකර්ම හා වාරිමාර්ග සංවර්ධන අංශය
V. මුදල් හා ආයතන අංශය

ඉහත අංශ අතුරින් මූල්‍ය හා ආයතන අංශය දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය සහායක සේවාවන් සලසන අතර අනෙකුත් සියලුම අංශ සෘජුවම සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණයට සහ අධීක්ෂණයට අදාළ කාර්යයන්හි නියුක්ත වේ. (සංවිධාන ව්‍යුහය-ඇමුණුම් අංක 01)

## 3.1 දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

2014.12.31 දින වන විට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.


**වගු අංක 01**
**කාර්ය මණ්ඩල තොරතුරු**

| කාර්ය මණ්ඩල වර්ගීකරණය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක ශ්‍රේණියේ නිලධාරී | 35 | 21 | 14 |
| ද්විතීය මට්ටමේ නිලධාරී | 35 | 24 | 11 |
| තෘතීය මට්ටමේ නිලධාරී | 01 | 01 | - |
| ප්‍රාථමික මට්ටමේ නිලධාරී | 18 | 14 | 04 |
| එකතුව | 89 | 60 | 29 |

## 3.2 අයවැය තොරතුරු

2014 වර්ෂය සඳහා අනුමත වූ වියදම් ඇස්තමේන්තුව සහ වාර්ෂික වියදම සහ ප්‍රස්ථාර අංක 01 මගින් ඉදිරිපත් කෙරේ. අයවැයගත තොරතුරු පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඇමුණුම 02 ලෙස ඉදිරිපත් කර ඇත.

**ප්‍රස්ථාර 01**
**අයවැය තොරතුරු - 2014**



## 04 දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

"දස අවුරුදු සංවර්ධන සැලැස්ම" තුලින් ඉස්මතු කළ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණ පෙර දැරිව සාමාජීය හා, ප්‍රාදේශීය විෂමතාවන් අවම කරමින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කිරීමට සමත් අංගසම්පූර්ණ ජාතික සංවර්ධන වැඩසටහනක් රජය මඟින් ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා අනුගතව විවිධ අංශයන්හි සංවර්ධන විෂමතාවයන් අවම කිරීම මෙන්ම අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනු ලබයි. මේ අනුව රජය මඟින් ප්‍රධාන සංවර්ධන තේමාවන් යටතේ කුඩා, මධ්‍යම හා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් 2262ක් ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘති අතුරින් 357ක්, ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 500 ඉක්මවා යන මහා පරිමාණ ව්‍යාපෘති වේ.

**වගු අංක 02**
**සමස්ථ පිරිවැය ඇස්තමේන්තුවට අනුව ව්‍යාපෘති වර්ගීකරණය (රු.මි.)**

| අරමුදල් ප්‍රභවය | 500 < | 50 -500 | 50 > | එකතුව |
|---|---|---|---|---|
| විදේශීය | 164 | 37 | 16 | 217 |
| දේශීය | 193 | 852 | 1000 | 2,045 |
| **සමස්ථ** | **357** | **889** | **1016** | **2,262** |

රාජ්‍ය ආයෝජන උදෙසා යොදවා ඇති සම්පත් කාර්යක්ෂමව සහ ඵලදායී අන්දමින් උපයෝගී කොට ගන්නා බව තහවුරු කරනු වස්, මෙම සංවර්ධන ව්‍යාපෘතීන් විධිමත්ව හා අඛන්ඩව අධීක්ෂණය කිරීම හා අවශ්‍ය අවස්ථාවන් හි ඇගයීම සිදු කිරීමේ වගකීම ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එබැවින් 2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු පහතින් විස්තර කෙරෙණ විවිධ අධීක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් මෙම ව්‍යාපෘති හා වැඩසටහන් රාශිය අධීක්ෂණය කිරීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

### 4.1 අධීක්ෂණ ක්‍රමවේදයන්

2014 වර්ෂයේදී මෙම සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්හි ප්‍රගතිය අධීක්ෂණය කිරීමේදී දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් මෘදුකාංග පද්ධති, දෘඩ වාර්තාවන්, ක්ෂේත්‍ර චාරිකා මෙන්ම විශේෂ රැස්වීම් හා සාකච්ඡා හරහා සපයා ගත් දත්ත පදනම් කර ගන්නා ලදී. එක් එක් ක්‍රමවේදයන් යටතේ ලබා ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

#### 4.1.1 ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය (Integrated National Development Information System –INDIS )

විදේශීය සහ දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා දෙපාර්තමේන්තුව විසින් "ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය" (Integrated National Development Information System –INDIS ) පවත්වාගෙන යනු ලබයි. මෙම තොරතුරු

පද්ධතිය මඟින් සංවර්ධන ව්‍යාපෘතීන් ඇස්තමේන්තුගත පිරිවැය හා එකඟ වූ කාල පරාසය තුල ක්‍රියාත්මක වන්නේ දැයි මාසිකව අධීක්ෂණය කිරීම සහ ප්‍රාග්ධන හා පුනරාවර්ථන වියදම් කාර්තුමය වශයෙන් අධීක්ෂණය කිරීමට පහසුකම් සලසා ඇත.

සංවර්ධන ව්‍යාපෘතීන් වල ආරම්භයේ සිට අවසානය දක්වා වන සියලුම තොරතුරු ගබඩා කිරීමට "ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය" පහසුකම් සලසා ඇත. ඒ අනුව 2014 වර්ෂය අවසාන වන විට පිරිවැය ඇස්තමේන්තු රුපියල් මිලියන 500ට වැඩි විදේශ ණය හා ප්‍රදාන මත මූල්‍යණය වන ව්‍යාපෘති 136 ක් එම ව්‍යාපෘතීන්හි කාර්ය මණ්ඩලය හරහා මාසිකව යාවත්කාලීන කරමින් මෙම පද්ධතියට ඇතුලත් කර තිබූ අතර එම දත්ත උපයෝගී කර ගනිමින් ව්‍යාපෘති ගැටළු හඳුනා ගෙන, කඩිනම් විසඳුම් ලබා දී අඛන්ඩ ක්‍රියාකාරිත්වය සහතික කරන ලදී.

එමෙන්ම, මෙම තොරතුරු පද්ධතිය මඟින් පරිහරණය කරන්නන්ගේ අවශ්‍යතාවය අනුව පළාත් සහ දිස්ත්‍රික් මට්ටමෙන්ද, අංශික හා අමාත්‍යාංශ අනුවද, අරමුදල් සපයන ආයතන සහ ක්‍රියාත්මක කරනු ලබන ආයතන වශයෙන් ද, එක් එක් ව්‍යාපෘතීන් අනුවද  අදාළ තොරතුරු වෙන් වෙන් වශයෙන් වාර්තා ලබා ගැනීමට මෙම පද්ධතිය මඟින් පහසුකම් සලසා ඇත. ඒ අනුව, මෙමඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ විනිවිදභාවය සහ යහපාලනය තහවුරු කිරීමට මහඟු දායකත්වයක් සපයනු ලබයි.

2014 වර්ෂය තුල රේඛීය අමාත්‍යාංශ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයන්හි නිලධාරීන් 278 දෙනෙකු සඳහා මෙම පද්ධතිය භාවිතා කිරීම පිළිබඳ පුහුණුව ලබා දෙන ලදි. ඒ අනුව 2014 වර්ෂයේදී මෙම දත්ත පද්ධතිය හරහා වාර්තා ලබා ගනිමින් එක් එක් ක්ෂේත්‍රයන්හි අධීක්ෂණය කරන ලද ව්‍යාපෘතීන් සංඛ්‍යාව පහත සඳහන් වේ.

**වගු අංක 03**
**ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය හරහා අධීක්ෂණය කරන ලද**
**විදේශ අරමුදල් ව්‍යාපෘති - 2014**

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| මහා මාර්ග හා ප්‍රවාහන | 47 |
| ජල සම්පාදන හා සනීපාරක්ෂක | 22 |
| විදුලිය සම්පාදන | 21 |
| සෞඛ්‍ය | 07 |
| අධ්‍යාපන හා කුසලතා සංවර්ධන | 06 |
| කෘෂිකර්ම, වැවිලි කර්මාන්ත, ඉඩම් හා වාරි මාර්ග | 10 |
| කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණ | 05 |
| වරාය සංවර්ධන | 05 |
| මූල්‍ය | 01 |
| ග්‍රාමීය ආර්ථික සංවර්ධන | 09 |
| සන්නිවේදන හා මාධ්‍යය | 01 |
| පාරිසරික | 01 |
| ධීවර | 02 |

### 4.1.2 දේශීය සහ විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ත්‍රෛමාසිකව, කාර්තුමය ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතිය තුළින් අධීක්ෂණය කිරීම

මේ හැර, දේශීය සහ විදේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක වන අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය ත්‍රෛමාසිකව විමසා බැලීම සඳහා රේඛීය අමාත්‍යාංශ හා සබැඳි වෙබ් අඩවිගත දත්ත පද්ධතියක් ද දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලැබේ.

සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන් අදාළ මුදල් වර්ෂය තුල ඒවායේ සමස්ත ප්‍රතිපාදනය හා වියදම් වල ප්‍රගතිය මෙන්ම නියමිත කාලසටහනට අනුව ඒවා ක්‍රියාත්මක වන්නේද, නොවන්නේද, නැතහොත් තාවකාලිකව නැවතී තිබේද යන කරුණු පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව මඟින් අදාළ ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්ගෙන් සහ රේඛීය අමාත්‍යාංශ වලින් තොරතුරු ලබා ගන්නා අතර අමාත්‍යාංශ තුල ක්‍රියාත්මක වන වැඩසටහන් හා ව්‍යාපෘතීන්වල ප්‍රමාදයන් හා ඊට හේතූන් මෙමඟින් විශ්ලේෂණය කර අදාළ මග පෙන්වීම්ද සිදු කරනු ලබයි.

ඒ අනුව , 2014 වර්ෂය අවසන් වන විට විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් 197 ක් සහ දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 1052 ක තොරතුරු මෙම පද්ධතියට ඇතුළත් කර ඇති අතර මෙම තොරතුරු පදනම් කර ගෙන සකසන ලද විශ්ලේෂණාත්මක වාර්තා අදාල අමාත්‍යාංශයන්හි 2014 වර්ෂයේ අයවැය පිළිබඳ තීරණ ගැනීමේ සාකච්ඡා සහ අයවැය යෝජනා සකස් කිරීම සඳහා ඉදිරිපත් කරමින් ඉහළ නිලධාරීන්ට නිවැරදි තීරණ ගැනීමට පහසුකම් සලසන ලදී. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයන් විසින් 2015 වර්ෂයේ අයවැය සාකච්ඡා සඳහා ඉදිරිපත් කළ වාර්තා සංඛ්‍යාව පහත පරිදි වේ.

**වගු අංක 04**
**අයවැය සාකච්ඡා සඳහා වාර්තා ඉදිරිපත් කිරීම**

| අංශය | වාර්තා ගණන |
|---|---|
| ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන අංශය | 09 |
| මානව සම්පත් සංවර්ධන අංශය | 25 |
| වෙළඳ හා කාර්මික සංවර්ධන අංශය | 18 |
| කෘෂිකර්ම හා වාරිමාර්ග සංවර්ධන අංශය | 08 |

### 4.1.3 ප්‍රගති වාර්තා මඟින් අධීක්ෂණය කිරීම

මෙම විද්‍යුත් පද්ධතිවල අන්තර්ගත නොකළ එහෙත් රේඛීය අමාත්‍යාංශවල ක්‍රියාත්මක කරනු ලබන බොහෝමයක් ව්‍යාපෘති හෝ වාර්ෂික සංවර්ධන වැඩසටහන් අදාල අමාත්‍යාංශ මඟින් කාර්තුමය ප්‍රගති වාර්තා ලෙස මෙම දෙපාර්තමේන්තුවට එවන අතර එම වාර්තා පදනම් කර ගෙන ලබා ගන්නා තොරතුරු මඟින් හඳුනාගනු ලබන ගැටළු අධීක්ෂණය කිරීමද මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් වලට අයත් වේ.

## 4.2 ජාතික මෙහෙයුම් මැදිරිය (NOR) පවත්වාගෙන යාම

ජාතික මෙහෙයුම් මැදිරිය රජයේ සංවර්ධන කටයුතු පිළිබඳ තීරණ ගැනීමේ ප්‍රධාන පහසුකම් සපයන මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. 2014 වර්ෂයේදී මෙම පහසුකම උපයෝගී කර ගනිමින් ප්‍රතිපත්ති සම්පාදකයන්, සංවර්ධන සැලසුම්කරුවන්, විදේශීය සංවර්ධන ආධාර ආයතන, කොන්ත්‍රාත්කරුවන් වැනි පාර්ශවයන් සඳහා නවීන විද්‍යුත් සහ දෘශ්‍ය මාධ්‍ය හරහා ව්‍යාපෘති කළමනාකරණය ශක්තිමත් කිරීමට විවිධ සාකච්ඡා පවත්වන ලදි.

වර්ෂය තුලදී තාක්ෂණික පහසුකම් වැඩි කිරීම තුලින් ජාතික මෙහෙයුම් මැදිරිය වඩාත් ඵලදායී ආකාරයෙන් භාවිත කිරීම තහවුරු කරන ලදි.

## 4.3 ක්ෂේත්‍ර චාරිකා මගින් ප්‍රගතිය අධීක්ෂණය කිරීම

ව්‍යාපෘති අධීක්ෂණයේදී ක්ෂේත්‍ර චාරිකා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය තුළින් සහ ත්‍රෛමාසික ප්‍රගති වාර්තා මඟින් ලබා ගන්නා තොරතුරු වලට අමතරව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ක්ෂේත්‍ර චාරිකාවල නිරත වීම තුළින් ද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ දී පැන නඟින ගැටළු පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගනු ලැබේ. මෙම ක්ෂේත්‍ර චාරිකාවලදී ප්‍රතිලාභීන්ගෙන් සහ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලබා ගන්නා තොරතුරු, ප්‍රතිචාර සහ ඍජු නිරීක්ෂණයන්හි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති කිහිපයකම කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීමට අවශ්‍ය මැදිහත්වීම් දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ඇත.

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ යථා තත්ත්වය අවබෝධ කර ගැනීමට ක්ෂේත්‍ර චාරිකා උපකාරී වන අතර, ව්‍යාපෘති කාර්ය මණ්ඩල විසින් ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතියට ඇතුලත් කරනු ලබන තොරතුරු පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක් කිරීමේ අවස්ථාව ද මෙමඟින් උදා වේ. එයට අමතරව ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමටත්, ඒවා අදාළ බලධාරීන් වෙත යොමු කිරීමටත් මෙමඟින් අවස්ථාව ලැබේ. මෙම කරුණු අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට ක්ෂේත්‍ර චාරිකා විශාල බලපෑමක් සිදු කරනු ලබයි. 2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍ර චාරිකා 46 ක් සිදු කළ අතර නිරීක්ෂණය වූ කරුණු හා ගැටළු පිළිබඳව සලකා බලා සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල ආයතන හා පාර්ශව වෙත යොමු කර ඇත. මේ අතුරින් බොහෝ ගැටළු ඉතා කඩිනමින් විසඳීමට පියවර ගෙන ඇත.

**වගු අංක 05**

**ක්ෂේත්‍ර චාරිකා මඟින් ප්‍රගතිය අධීක්ෂණය කිරීම - 2014**

| අංශය | සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව | අදාල පාර්ශවයන්ගේ අවධානයට යොමු කළ ගැටළු |
|---|---|---|
| අධ්‍යාපන | 1 | 4 |
| කෘෂිකර්ම | 2 | 1 |
| සෞඛ්‍ය | 3 | 2 |
| කර්මාන්ත | 13 | 9 |
| මාර්ග හා ප්‍රවාහන | 5 | 4 |
| ජල සම්පාදන | 3 | 3 |

මඩු තලෛයි මන්නාරම් දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම










මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය






පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙහි සංවර්ධන කටයුතු අධීක්ෂණය





## 4.4 විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම

විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා 2014 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්, කොන්ත්‍රාත්කරුවන්, ආධාර සපයන පාර්ශවකරුවන්, රේඛීය අමාත්‍යාංශ නිලධාරීන් සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනෙකුත් දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගේද සහභාගීත්වයෙන් විශේෂ රැස්වීම් සහ සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී. මීට අමතරව වෙනත් රේඛීය අමාත්‍යාංශ විසින් සංවිධානය කරන ලද විශේෂයෙන්ම ජල සම්පාදනය, විදුලිබල, වාරි මාර්ග, මහා මාර්ග වැනි වැනි අංශයන්හි සංවර්ධන ව්‍යාපෘතිවල සාර්ථක ප්‍රතිඵල තහවුරු කිරීම සඳහා මෙම එක් එක් ව්‍යාපෘතීන්හි මෙහෙයුම් කමිටු රැස්වීම්, ප්‍රගති මාලෝචන රැස්වීම් සහ සාකච්ඡාවන් සඳහා දෙපාර්තමේන්තුවේ අදාල අංශ වල නිලධාරීන් සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

මෙයට අමතරව දෙපාර්තමේන්තු නිලධාරීන් එක් එක් ව්‍යාපෘති සම්බන්ධව ඊට අදාල ආයතන විසින් පවත්වන ලද රැස්වීම් හා සාකච්ඡාවන් සඳහා සහභාගී වෙමින් අධීක්ෂණ කටයුතු සිදුකර ඇත.

**වගු අංක 06**
**2014 වර්ෂයේ දී පවත්වන ලද විශේෂ රැස්වීම් සහ සාකච්ඡා**

| රැස්වීම් / සාකච්ඡා වර්ගීකරණය | සංඛ්‍යාව |
|---|---|
| ප්‍රගති සමාලෝචන රැස්වීම් | 59 |
| ආංශික රැස්වීම් | 09 |
| අරමුදල් සපයන ආයතන සමඟ පවත්වන රැස්වීම් | 20 |
| මෙහෙයුම් කමිටු රැස්වීම්/ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම් | 49 |
| වෙනත් විශේෂ රැස්වීම්/සාකච්ඡා | 50 |

## 4.5 ඇගයීම හා නිරීක්ෂණ තොරතුරු ව්‍යාප්ත කිරීම

### 4.5.1 ඇගයීම් තොරතුරු පද්ධතිය (EIS) පවත්වාගෙන යාම

දේශීය සහ විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සහ නිම කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්වල ඇගයීම් වාර්තාවන්හි සංක්ෂිප්ත විස්තර ඇතුලත් කිරීම සඳහා වෙබ් අඩවිගත ඇගයීම් තොරතුරු පද්ධතියක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇත. මෙම තොරතුරු පද්ධතියේ මූලික අරමුණ වන්නේ ව්‍යාපෘති ඇගයීම් මඟින් හෙළි වන කරුණු, නිරීක්ෂණ සහ අධ්‍යයනයන් ඇසුරින් ලබා ගත් දැනුම සහ උගත් පාඩම්, අයවැය සකස් කිරීමේදී, ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම්කරණය වැනි කටයුතු වලදී වඩාත් ඵලදායි ලෙස භාවිතයට ගැනීම සහතික කිරීමයි. ඇගයීම් සිදු කරන ලද ව්‍යාපෘති 46 ක වාර්තා දැනට මෙම වෙබ් අඩවිගත තොරතුරු පද්ධතියට ඇතුළත් කර ඇති අතර ඇගයීම් කළ ව්‍යාපෘති 05ක් 2014 වර්ෂය තුලදී හඳුනා ගන්නා ලදි.

### 4.5.2 ව්‍යාපෘති ඇගයීම

දෙපාර්තමේන්තුව විසින්, නිම කරන ලද ව්‍යාපෘතීන් මෙන්ම ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන් සඳහා ද කලින් කලට ඇගයීම් සිදුකරනු ලබයි. මෙයට අමතරව මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු මෙන්ම විවිධ ව්‍යාපෘතීන් වලට අදාලව කරනු ලබන ඉල්ලීම් මතද ඇගයීම් සිදුකරනු ලබයි. 2014 වසර තුල දී, ගැමිදිරිය ව්‍යාපෘතිය, ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය, කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත පුර වැඩසටහන පළිබඳ කඩිනම් ඇගයීම් සිදු කරන ලදි.

## 05 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ වූ තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය (ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම පළිබඳ උපායමාර්ගිකව ඉහළ නැංවීම)

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ව්‍යාපෘති සම්බන්ධීකරණය, අධීක්ෂණය, ඇගයීම හා අදාල ගැටළු නිරාකරණය කිරීමට අදාලව වඩාත් ඵලදායී කාර්යභාරයක් උපායමාර්ගිකව ඉටු කිරීමට හැකි වන පරිදි ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීමයි.

2014 වසර තුල, මෙම ව්‍යාපෘතිය මඟින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කරන ලදී.

1. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා, ඉහත සඳහන් ව්‍යාපෘති ඇගයීම් සිදු කිරීමට පහසුකම් සපයන ලදී.
2. එම ඇගයීම් වාර්තා, පාර්ශ්වකරුවන් සම්බන්ධ වූ වැඩමුළුවක් තුලදී සාකච්ඡාවට බඳුන් කල අතර එහිදී ඔවුන්ගෙන් ලබා ගන්නා ලද අදහස් වාර්තාව පිළියෙල කිරීම සඳහා ඉවහල් කර ගන්නා ලදී.

## 06 විශේෂ ක්‍රියාකාරකම්

### 6.1 " සංවර්ධන ව්‍යාපෘතීන්හි කාර්යසාධනය - 2014 " ප්‍රකාශයට පත් කිරීම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් මත දේශීය අරමුදල් හා විදේශීය ණය හා ප්‍රදාන මත ක්‍රියාත්මක වන සියළුම සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අමාත්‍යාංශ මට්ටමෙන් ඇතුළත් කරන ලද "සංවර්ධන ව්‍යාපෘතීන්හි කාර්යසාධනය - 2014" අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලදී.

### 6.2 දැයට කිරුළ ප්‍රදර්ශණයට සමගාමීව කෙරෙන සංවර්ධන වැඩ අධීක්ෂණය කිරීම

භාණ්ඩාගාර ලේකම්තුමාගේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තුව විසින් 2014 දැයට කිරුළ ප්‍රදර්ශණයට සමගාමීව ආශ්‍රිත දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ කඩිනම් ඇගයීමක් සිදුකරන ලදි. මේ සඳහා කුරුණෑගල, පුත්තලම හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වල ක්ෂේත්‍ර චාරිකා සිදුකරමින් ලබාගත් නිරීක්ෂණ තොරතුරු මත පිළියෙල කල වාර්තා අදාළ නිලධාරීන් වෙත ලබා දෙන ලදී.

### 6.3 අයවැය යෝජනා අධීක්ෂණය කිරීම

2014 වර්ෂය සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ අයවැය කථාවේ ඇතුලත් එක් එක් රේඛීය අමාත්‍යාංශ හා ඒ යටතේ එන ආයතන මඟින් ක්‍රියාත්මක කළ යුතු අයවැය යෝජනා 112 ක් අධීක්ෂණය කරන ලදී. එමෙන්ම අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව විශ්ලේෂණ වාර්තා තුනක් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ඉදිරිපත් කරන ලදී.

### 6.4 පෝෂණ මල්ල වැඩසටහන ඇගයුමට ලක් කිරීම





භාණ්ඩාගාර ලේකම්තුමාගේ උපදෙස් පරිදි පෝෂණ මල්ල ජාතික වැඩසටහන පිළිබඳ කඩිනම් ඇගයීමක් සිදුකරන ලදි.

මෙම වැඩසටහන යටතේ සමෘද්ධිලාභී පවුල් වල සුදුසු ප්‍රතිලාභීන් සඳහා සමුපකාර වෙළඳසැල් මගින් පෝෂණීය ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මාසිකව රු.500 ක වටිනාකමකින් ආහාර මුද්දර නිකුත් කරනු ලැබේ.

මෙම ඇගයීම් ක්‍රියාවලියේදී ඒ සඳහා කෑගල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක තෝරා ගනු ලැබූ අතර,වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ සියලු පාර්ශවයන් සමඟ රැස්වීම් පැවැත්වීමත්, පවතින දත්ත වාර්තා පරීක්ෂා කිරීමත් සිදු කරන ලදි. තවද, මේ තුළින් අනාවරණය

කරගනු ලැබූ තොරතුරු පදනම් කරගෙන සකස් කරන ලද වාර්තාව මෙම වැඩසටහන තව දුරටත් දියුණු කිරිම සඳහා තීරණ ගනු ලබන පාර්ශවයන් වෙත යොමු කරන ලදි.

### 6.5 නියඟයෙන් පිඩාවට පත් ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සහ සහනාධාර ලබා දීම අධීක්ෂණය

දෙපාර්තමේන්තුව මගින් නියගයෙන් පීඩාවට පත් ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම සහ නියං සහනාධාර ලබාදීමේ කඩිනම් සංවර්ධන වැඩසටහන අධීක්ෂණයට ලක් කිරිම හා ඊට අදාළ ප්‍රගතිය සම්බන්ධ කැබිනට් පත්‍රිකාව සකස් කොට ඉදිරිපත් තරන ලදි.

මේ සඳහා දිස්ත්‍රික්ක 17ක් ආවරණය කරමින් ව්‍යාපෘති පළිබඳ දත්ත එකතු කිරීම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ ක්‍රමවේදයන් හරහා සිදු කරන ලදි.

## 07 කාර්යමණ්ඩල පුහුණු කිරීම සහ හැකියා වර්ධනය


දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියා වර්ධනය කිරීම උදෙසා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර එහි දී ව්‍යාපෘති සැලසුම් කිරීම, අධීක්ෂණය සහ ඇගයීම ඉලක්ක කර ගත් දේශීය සහ විදේශීය පුහුණු වීම් සඳහා අවස්ථාව ලබා දෙන ලදි. සියළුම පුහුණු වැඩමුළු අවසන් කිරීමෙන් පසු එම පුහුණුවීම් තුළින් ලබා ලන්නා ලද දැනුම සහ කුසලතා අන් අය සමග හුවමාරු කරගැනීමේ අවස්ථාව නිලධාරීන්ට ලබා දෙන ලද අතර එය ඔවුන්ගේ ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය වීම සඳහා ද ඉවහල් විය.

2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව් නිලධාරීන් සහභාගී වූ දේශීය හා විදේශීය පුහුණු හා වැඩමුළු පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

**වගු අංක 08**
**කාර්යමණ්ඩල පුහුණු කිරීම**

| පුහුණු වැඩසටහන | දේශීය / විදේශීය | සහභාගී වූ නිලධාරීන් ගණන |
|---|---|---|
| කෙටි කාලීන පුහුණු වීම් | විදේශීය | 08 |
| දිගු කාලීන පුහුණු වීම් | විදේශීය | 01 |
| කෙටි කාලීන පුහුණු වීම් | දේශීය | 13 |
| දිගු කාලීන පුහුණු වීම් | දේශීය | 01 |
| දෙමළ භාෂා පුහුණු පාඨමාලා | දේශීය | 15 |
| සිංහල භාෂා පුහුණු පාඨමාලා | දේශීය | 04 |
| එකතුව | | **42** |

# Department of Project Management and Monitoring - Organizational Structure 2014



Annex - I

ශීර්ෂ අංකය
**தலைப்பு இல.**
**Head No** } **280**

දෙපාර්තමේන්තුව
**திணைக்களம்**
**Department** }

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
**கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத் திணைக்களம்**
**Department of Project Management & Monitoring**

## වියදම් සාරාංශය
## செலவுச் சுருக்கம்
## Summary of Expenditure

| වැඩසටහන<br>நிகழ்ச்சித் திட்டம்<br>Programme | විස්තරය<br>விவரணம்<br>Discription | 2013<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>අනුමත ඇස්තමේන්තුව<br>அனுமதிக்கப்பட்ட மதிப்பீடு<br>Approved Estimate<br>Rs. | 2014<br>සංශෝධිත ඇස්තමේන්තුව<br>மீளாய்வு செய்யப்பட்ட மதிப்பீடு<br>Revised Estimate<br>Rs. | 2014<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>ඉතිරිය<br>சேமிப்புக்கள்<br>Savings<br>Rs. |
|---|---|---|---|---|---|---|
| 2 | පුනරාවර්තන වියදම<br>மீண்டுவரும் செலவு<br>Recurrent Expenditure | 63,246,687 | 77,975,000 | 64,850,000 | 61,695,802 | 617,198 |
| | ප්‍රාග්ධන වියදම<br>மூலதனச் செலவு<br>Capital Expenditure | 4,916,420 | 20,200,000 | 9,200,000 | 9,748,725 | 1,988,275 |
| | එකතුව/மொத்தம்<br>Total | 68,163,107 | 98,175,000 | 74,050,000 | 71,444,527 | 2,605,473 |

ශීර්ෂ අංකය/**தலைப்பு இல**/**Head No :280**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව- ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
**அமைச்சு/திணைக்களம்: கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத் திணைக்களம்**
**Ministry/Department : Department of Project Management & Monitoring**

වැඩ සටහන් අංකය/ **நிகழ்ச்சித் திட்டம் /Programme No:02**

ව්‍යාපෘතිය **01-** ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණය
**கருத்திட்டம் : 01 கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்பு**
**Project :01 - Project Management & Monitoring**

පුනරාවර්තන වියදම්/ **மீண்டுவரும் செலவு /Recurrent Expenditure**

| විස්තරය<br>விவரணம்<br>Discription | 2013<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>අනුමත ඇස්තමේන්තුව<br>அனுமதிக்கப்பட்ட மதிப்பீடு<br>Approved Estimate<br>Rs. | 2014<br>සංශෝධිත ඇස්තමේන්තුව<br>மீளாய்வு செய்யப்பட்ட மதிப்பீடு<br>Revised Estimate<br>Rs. | 2014<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>ඉතිරිය<br>சேமிப்புக்கள்<br>Savings<br>Rs. |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩි නඩි<br>ஆளுக்குரிய வேதானாதிகள்<br>Personal Emoluments | 25,577,315 | 32,000,000 | 25,829,000 | 25,708,110 | 120,890 |
| වෙනත්<br>ஏனையவை<br>Other | 37,669,372 | 45,975,000 | 36,484,000 | 35,987,692 | 496,308 |
| එකතුව/மொத்தம்<br>Total | 63,246,687 | 77,975,000 | 62,313,000 | 61,695,802 | 617,198 |

ශීර්ෂ අංකය/ **தலைப்பு இல /Head No :280**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව- ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
**அமைச்சு/திணைக்களம்:** கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத் திணைக்களம்
**Ministry/Department : Department of Project Management & Monitoring**

වැඩ සටහන් අංකය/ **நிகழ்ச்சித் திட்டம் /Programme No:02**

මූලධන වියදම්/ **மூலதனச் செலவு / Capital Expenditure**

| මූලධන වියදම / மூலதனச் செலவு Capital Expenditure<br>වැය විෂය අංකය<br>விடய குறியீடு<br>Object Code | විස්තරය<br>விவரணம்<br>Discription | 2013<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>අනුමත ඇස්තමේන්තුව<br>அனுமதிக்கப்பட்ட மதிப்பீடு<br>Approved Estimate<br>Rs. | 2014<br>සංශෝධිත ඇස්තමේන්තුව<br>மீளாய்வு செய்யப்பட்ட மதிப்பீடு<br>Revised Estimate<br>Rs. | 2014<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>ඉතිරිය<br>சேமிப்புக்கள்<br>Savings<br>Rs. |
|---|---|---|---|---|---|---|
| | <u>මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම</u><br><u>மூலதன இருப்புச் சொத்துக்களின் முன்னேற்றம்</u><br>**<u>Rehabilitation & Improvement of Capital Assets</u>** | | | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම්<br>கட்டிடங்களும் அமைப்புக்களும்<br>Bulding & Structure | 245,000 | - | - | - | - |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ<br>இயந்திரவகையும் உபகரணமும்<br>Plant Machinary & Equipment | - | 200,000 | 200,000 | 12,347 | 187,653<br>- |
| 2003 | වාහන<br>வாகனங்கள்<br>Vehicles | 539,359 | 500,000 | 500,000 | 189,300 | 310,700<br>- |
| | <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u><br><u>மூலதன இருப்புச் சொத்துக்கள் கைப்பற்றல்</u><br>**<u>Acquisition of Capital Assets</u>** | | | | | |
| 2101 | වාහන | - | - | 2,520,000 | 2,520,000 | - |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ<br>தளபாட காரியாலய உபகரணமும்<br>Furniture & Office Euipment | 29,190 | - | - | - | -<br>- |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ<br>ප්‍රාග්ධන මාරුකිරීම් | 625,000 | - | - | - | - |
| 2401 | මානව සම්පත් සංවර්ධනය හා කාර්ය කාර්ය මණ්ඩල පුහුණු කිරීම්<br>பயிற்சியும் ஆளுமை விருத்தியும்<br>Training & Capacity Building | 478,140 | 500,000 | 517,000 | 499,998 | 17,002<br>- |
| 2502 | ව්‍යාපෘති ඇගැයීම හා වෙබ් අඩවි පාදක කරගත් අධීක්ෂණ පද්ධතිය<br>වෙනත් ආයෝජන | 2,999,731 | 4,000,000 | 3,000,000 | 2,998,590 | 1,410 |
| | | 4,916,420 | 5,200,000 | 6,737,000 | 6,220,235 | 516,765 |

ශීර්ෂ අංකය/ **தலைப்பு இல /Head No :280**

වැඩ සටහන් අංකය/ **நிகழ்ச்சித் திட்டம் /Programme No: 02**

මූලධන වියදම්/ **மூலதனச் செலவு / Capital Expenditure**

| වැය විෂය අංකය<br>விடய குறியீடு<br>Object Code | මූලධන වියදම මූலதனச் செலவு<br>Capital Expenditure<br><br>විස්තරය<br>விவரணம்<br>Discription | 2013<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>අනුමත ඇස්තමේන්තුව<br>அனுமதிக்கப்பட்ட மதிப்பீடு<br>Approved Estimate<br>Rs. | 2014<br>සංශෝධිත ඇස්තමේන්තුව<br>மீளாய்வு செய்யப்பட்ட மதிப்பீடு<br>Revised Estimate<br>Rs. | 2014<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>ඉතිරිය<br>சேமிப்புக்கள்<br>Savings<br>Rs. |
|---|---|---|---|---|---|---|
| 2502 | **ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ හැකියා ශක්තිමත් කිරීම**<br>**திட்ட அமுலாக்கலின் ஆற்றலை வலுவடையசெய்தல்**<br>**Strengthening the plan Implementation Capacity**<br>*වෙනත් මූලධන වියදම්*<br>*ஏனைய மூலதன முதலீடு*<br>*Other Capital Expenditure*<br>වෙනත් ආයෝජන<br>ஏனைய முதலீடு<br>Other Capital Investment | - | 15,000,000 | 5,000,000 | 3,528,490 | 1,471,510 |
| 2502 | සංවර්ධන ප්‍රතිඵල කළමනාකරණය<br>அபிவிருத்தி பெறுபேறுகளை முகாமைப்படுத்தல்<br>Managing for Development Results<br>*වෙනත් මූලධන වියදම්*<br>*ஏனைய மூலதன முதலீடு*<br>*Other Capital Expenditure*<br>වෙනත් ආයෝජන<br>ஏனைய முதலீடு<br>Other Capital Investment | | - | - | - | - |
| | **එකතුව / மொத்தம்**<br>**Total** | 4,916,420 | 20,200,000 | 11,737,000 | 9,748,725 | 1,988,275 |

**මූල්‍ය ප්‍රභවයන්**
**நிதி மூலங்கள்**
**Financial Sources**

| වැඩ සටහන நிகழ்ச்சித் திட்டம் **Programme** | විස්තරය விவரணம் **Discription** | | | **2013** සත්‍ය වියදම உள்ளபடி செலவு **Actual Expenditure Rs.** | **2014** අනුමත ඇස්තමේන්තුව அனுமதிக்கப்பட்ட மதிப்பீடு **Approved Estimate Rs.** | **2014** සංශෝධිත ඇස්තමේන්තුව மீளாய்வு செய்யப்பட்ட மதிப்பீடு **Revised Estimate Rs.** | **2014** සත්‍ය වියදම உள்ளபடி செலவு **Actual Expenditure Rs.** | **2014** ඉතිරිය சேமிப்புக்கள் **Savings Rs.** |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | ඒකාබද්ධ අරමුදල | திட்ட நிதியம் | Consolidated Fund | 68,163,107 | 83,175,000 | 69,050,000 | 67,916,037 | 1,133,963 |
| | විශේෂ නීති සේවා | வசேட சட்டம் | Special Law | - | - | - | - | - |
| | *විදේශාධාර* | *வெளிநாட்டு உதவி* | ***Foreign Aid*** | | | | | |
| | ණය | கடன்கள் | Loans | | | | | |
| | ආධාර | கொடைகள் | Grants | - | 15,000,000 | 5,000,000 | 3,528,490 | 1,471,510 |
| | *ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර* | *மீள்ளிக்கப்படக்கூடிய வெளிநாட்டு உதவி* | ***Reimbursable Foreign Aid*** | | | | | |
| | ණය | கடன்கள் | Loans | - | - | - | - | - |
| | ආධාර | கொடைகள் | Grants | - | - | - | - | - |
| | ප්‍රතිපාර්ශවීය අරමුදල් | எதிரிணை நிதியம் | Counterpart Funds | - | - | - | - | - |
| | විදේශාධාර | *வெளிநாட்டு உதவி* | Foreign Aid | - | - | - | - | - |
| | **මුළු වියදම** | **மொத்த செலவுகள்** | **Total Expenditure** | 68,163,107 | 98,175,000 | 74,050,000 | 71,444,527 | 2,605,473 |

ශීර්ෂ අංකය/ தலைப்பு இல / Head No :280

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව- ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
**அமைச்சு/திணைக்களம்: கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத் திணைக்களம்**
**Ministry/Department : Department of Project Management & Monitoring**

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම : විෂය අංකය 28001**
**அரச ஊழியர்களுக்கான முற்பண ஆ(B) கணக்கு : விடய இல : 28001**
**Public Officers Advance Accounts :Subject No 28001**

| වර්ෂය / ஆண்டு / Year<br>විස්තරය / **விவரணம்** / Discription | 2013<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>අනුමත ඇස්තමේන්තුව<br>அனுமதிக்கப்பட்ட மதிப்பீடு<br>Approved Estimate<br>Rs. | 2014<br>සංශෝධිත ඇස්තමේන්තුව<br>மீளாய்வு செய்யப்பட்ட மதிப்பீடு<br>Revised Estimate<br>Rs. | 2014<br>සත්‍ය වියදම<br>உள்ளபடி செலவு<br>Actual Expenditure<br>Rs. | 2014<br>සීමා ඉක්මවීම<br>எல்லை மீறிய வரையறை<br>Limits Exceeds<br>Rs. |
|---|---|---|---|---|---|
| ආරම්භක ශේෂය<br>ஆரம்ப மீதி<br>Openning Balance | 12,954,686.11 | | | 11,711,688.86 | |
| වර්ෂයේ හර<br>ஆண்டு கால வரவு<br>Debit in during the year | 4,705,430.50 | 5,000,000.00 | | 5,169,442.14 | |
| එකතුව/ மொத்தம் /Total | 17,660,116.61 | | | 16,881,131.00 | |
| අඩු කළා/ கழி /Less | | | | | |
| වර්ෂයේ මුළු බැර<br>ஆண்டு கால செலவு<br>Credit in during the year | 5,948,427.75 | 2,200,000.00 | | 5,504,399.28 | |
| වර්ෂය අවසානයේ හර<br>ஆண்டு முடிவில் மீதி வரவு<br>End of the year Debit Balance | 11,711,688.86 | 20,000,000.00 | | 11,376,731.72 | |

| **<u>සටහන/ குறிப்பு /Note</u>** | **හර/ வரவு/Debit** | **බැර/ செலவு/Credit** |
|---|---|---|
| වර්ෂයේ සීමාවට බලපාන හර සහ බැර (ශීර්ෂ අංක 280011) | 3,417,283.14 | 2,440,159.78 |
| වර්ෂයේ සීමාවට බල නොපාන හර සහ බැර (ශීර්ෂ අංක 280012) | 1,752,159.00 | 3,064,239.50 |
| එකතුව | 5,169,442.14 | 5,504,399.28 |
| வருடாந்த வரையறைகள் மீது விளைவுளை ஏற்படுத்தும் வரவு செலவுகள் ( விடய இல. 280011 ) | 3,417,283.14 | 2,440,159.78 |
| வருடாந்த வரையறைகள் மீது விளைவுகள் ஏற்படுத்தாத வரவு செலவுகள் ( விடய இல. 280012 ) | | |
| மொத்தம் | 1,752,159.00 | 3,064,239.50 |
| மொத்தம் | 5,169,442.14 | 5,504,399.28 |
| Debit & Credit which affect on Annual limit (Subjects No 280011) | | |
| Debit & Credit which does not affect on Annual limit (Subjects No 280012) | 3,417,283.14 | 2,440,159.78 |
| Total | 1,752,159.00 | 3,064,239.50 |
| | 5,169,442.14 | 5,504,399.28 |